2019.09.24.



# මුලාවට තිත තබා සයිබර් අවකාශයේ ඇත්ත දැන ගනිමු

අන්‍යෝන්‍ය සබඳතා ගොඩනඟා ගනිමින් මානව වංශ කතාව තුළ මානවයා පුද්ගලාන්තර සන්නිවේදනය අතීතයේදී විවිධාකාරව සිදුකර ඇත. මානව සමාජයේ විකාශනයත් සමග මෙම පුද්ගලාන්තර සන්නිවේදනයේ පුළුල් වෙනස්කම් සිදු වී ඇත. මෙහිදී මූලිකව සිදුවී ඇත්තේ තාක්ෂණික අංශයේ සිදු වූ වෙනස්කම්ය. එනම් කාර්මික විප්ලවය සහ දෙවන ලෝක යුද්ධයේ බලපෑම සමග අන්තර්ජාලයේ සහ පරිගණකයේ ආගමනය සිදු වීමයි. ජාල සමාජ සැකැස්මට චන්ද්‍රිකා තාක්ෂණය අතින් සිදු වූ පෙරළියත් හේතු වූ බව පිළිගත යුතුය. 1960 ත් 1970 අතර කාලය තුළදී මෙම ජාල ක්‍රමය ව්‍යාප්ත වූ ආකාරය නව මාධ්‍ය ඉතිහාසය අධ්‍යනය කිරීමේදී දැක ගත හැක. අන්තර්ජාලයේ ව්‍යාප්තිය නිසා පුද්ගලාන්තර සන්නිවේදනය මුල්කර ගනිමින් ඇති වූ සබඳතාවල ජාලමය ස්වරූපයක් හඳුනාගත හැකි විය. මෙහිදී ජාල සමාජ පද්ධතියක් නිර්මාණය වීමට සමාජ ජාලයන්ගේ මැදිහත්වීම ප්‍රධාන වේ. E- mail Face book, Twitter, Web pages, Smart phones, Viber ආදි සමාජජාල මේ අතර ප්‍රධාන සමාජ ජාලයන් වේ. මෙම සමාජ

මුල් වී ඇත. 2004 වසරේ පෙබරවාරි 04 වැනිදා සිට මුහුණු පොත අන්තර්ජාලයට එක් වූ අතර දිනකට මුහුණු පොතට එක් වන්නන්ගේ ප්‍රමාණය මිලියන 757 වන අතර මිලියන 300 ක් දිනකට මුහුණු පොතට ඡායාරූප එකතු කරනු ලබයි. ආසියාතික රටක් වන ශ්‍රී ලංකාව තුළ දැකගත හැකි වන්නේ ද මුහුණු පොත හා සම්බන්ධව මෙවැනිම පරිසරයකි. ලංකාවේ සමාජ විද්‍යාඥයින් පෙන්වා දෙන ආකාරයට මුහුණු පොත අධ්‍යාපනික මාධ්‍යයක් ලෙස යොදාගත හැකිය. නමුත් අද වන විට ලංකාවේ මුහුණු පොත භාවිතා කරනු ලබන පරිශීලකයන්ගේ අරමුණ බවට පත්ව ඇත්තේ විනෝදාස්වාදයි. ලෝක ප්‍රජාවට සාපේක්ෂව ලංකාවේ ද මුහුණු පොත ඔස්සේ වෙළෙඳ ප්‍රචාරණය සිදුවන ආකාරය බොහෝ දෙනා දන්නා කරුණකි. මෙම වෙළෙඳ ව්‍යාපාර මහා පරිමාණ, කුඩා පරිමාණ සහ මධ්‍ය පරිමාණ ලෙස වර්ග කළ හැකිය. මෙහිදී බොහෝ විට අන්තර්ජාලය භාවිතා කරමින් වෙළෙඳ ප්‍රචාරණයේ යෙදෙන්නේ මහා පරිමාණ ව්‍යාපාරකරුවන්ය. මුහුණු පොත භාවිතා කරමින් මොවුන් ඉලක්කගත ග්‍රාහක පිරිස වෙත ළඟා වෙමින් තම වෙළෙඳ අවශ්‍යතා ඉතා සූක්ෂම ලෙස ඉටු කර ගනු ලබයි. එසේම මුහුණු පොතේ ජාලමය ස්වරූපය ව්‍යාපාරකරුවන්ට වඩා වාසිදායක කරුණක් වේ.

මෙලෙස දෛනික භාවිතයට ගන්නා මුහුණු පොත සමාජ සංවර්ධන ක්‍රියාවලියට මෙන්ම පුද්ගල සංවර්ධන ක්‍රියාවලිය අඩාල කිරීමට පුද්ගලයාගේ මානසික ශක්තිය බිඳ දැමීමට ද හේතු වේ. ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවතින රටකට මුහුණු පොත මගින් සිදු වන නිශේධනීය බලපෑම ඉතා ප්‍රබලය. විශේෂයෙන් මා පිය දූ දරු සබඳතාවය බිඳ වැටීමට මෙම මුහුණු පොත හේතු වී ඇති ආකාරය ජනමාධ්‍යයන් මගින් ඇසෙන පුවත් මගින් ගම්‍ය වේ. මුහුණු පොත අවභාවිතා කිරීම මුල් කරගෙන සිය දිවි හානි කර ගැනීම් කිහිපයක්ම පසුගිය සමයේ වාර්තා විය. එමගින් ප්‍රකාශ වන්නේ මුහුණු පොත වැනි සමාජ ජාල මාධ්‍යයන් සමාජයට එල්ල කර ඇති බලපෑමේ තීව්‍ර බවයි. ලංකාවේ පවතින ආර්ථික අපහසුතා හමුවේ කෙසේ හෝ දෙමාපියන් නිතරම උත්සහ ගනු ලබන්නේ තම දරුවාට උසස් ජීවන තත්ත්වයක් ළඟා කර දීමටය. මේ නිසා දෙමාපියන්ගේ ආරක්ෂාවෙන් දුරස් වන දරුවා සමාජ මාධ්‍ය භාවිතා කරමින් ඊට අනූරූපව තම ජීවිතය හැඩගස්වා ගැනීමට පෙළඹෙයි. අද වන විට ලංකාවේ පවතින ජාල සමාජය දෙස අවධානය යොමු කිරීමේදී පෙනී යන්නේ මෙම ජාල සමාජය නිර්මාණය වන්නේ ජනප්‍රියතාවය යන සාධකය මුල්කර ගෙන බවයි. අද වන විට ලංකාවේ විවිධ වෙළෙඳ ආයතන ද තම ආර්ථික කටයුතු සඳහා මෙම ජාල සමාජ පද්ධතිය භාවිතා කරයි. මෙහිදී වෙළෙඳ ව්‍යාපාරිකයන් සමාජ ජාල පරිශීලකයන් ඉලක්ක කර ගනිමින් තම වෙළෙඳ ප්‍රචාරණ කටයුතු පවත්වා ගෙන යයි. ජාල සමාජය සමඟ නිතරම ගැටෙන්නේ තරුණ පරපුර වන බැවින් මෙම ජාල සමාජ පද්ධතිය තුළ හුවමාරු වන ප්‍රධාන වෙළෙඳ භාණ්ඩය බවට පත්ව තිබෙන්නේ ද


**දමිත් සුමේන්ද්‍ර**
ජන සන්නිවේදන අධ්‍යයන අංශය
කැලණිය විශ්වවිද්‍යාලය.